# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2056 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 01/08/2024<br>පැය 1125 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයක් - හබරාදූව පොලිස් ස්ථානය.**

2024.08.01 වන දින අළුයම් කාලයේ හබරාදූව පොලිස් වසමේ දිවෙල්වත්ත ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයෙකුට යකඩ පොල්ලකින් පහරදී ඝාතනයකර එම සැකකරු හබරාදූව පොලිස් ස්ථානයට පැමිණ භාරවීමෙන් පසු හබරාදූව පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ දිවෙල්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු හා මරණකරු අතර කලක සිට පැවති පුද්ගලික ආරවුලක් මත මෙම ඝාතනය සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.07.31 වන දින දහවල් කාලයේදී ආමර් වීදිය පොලිස් වසමේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 201 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු,** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - සපුගස්කන්ද පොලිස් ස්ථානය.

2024.07.31 වන දින උදෑසන කාලයේදී පැලියගොඩ පොලිස් වසමේ වරාගොඩ ප්‍රදේශයේදී සපුගස්කන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත **නීති විරෝධී මත්පැන් ස්කාගාරයක්** වටලා **නීති විරෝධී මත්පැන් ලීටර් 33 මිලි ලීටර් 750 ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 4860 (බැරල් 27) ක්, ගෑස් සිලින්ඩර් 05 ක්, ගෑස් ලිප් 03 ක්, විදුලි වතුර මෝටරයක් ඇතුළු පෙරීමේ උපකරණ සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන පැලියගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 43, 45 ක් වන විදුලිපුර හා පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. සැකකටයුතු මරණයක් - ගම්පොල පොලිස් වසම.

2024.07.31 වන දින රාත්‍රි කාලයේ ගම්පොල පොලිස් වසමේ ලංකා ගමනාගමන මණ්ඩලයේ දැල්පිටියේ පිහිටි කාර්යාල භූමියේ පිහිටි වගා ළිදකට වැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට ගම්පොල පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වන ඩංසිනන්වත්ත, පූඩළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මරණකරු ලංකා ගමනාගමන මණඩලයේ දැල්පිටිය ප්‍රාදේශිය කාර්යාලයේ සේවය කරන කාර්යාල කාර්යය සහයකයෙකු වන බවට සිදු කරන ලද විමර්ෂනයේදී අනාවරණය වී ඇත. , මෘත දේහය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. ගම්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - ජා ඇල පොලිස් වසම.

2024.07.31 වන දින රාත්‍රී කාලයේ ජා ඇල පොලිස් වසමේ සුදුවැල්ල හන්දිය අසලදී ජා ඇල සිට පමුණුගම දෙසට ධාවනයවූ ලොරි රථයක් එම දිසාවටම ඉදිරියෙන් ගමන්කරමින් සිටි පා පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පා පැදිකරු බරපතල තුවාල ලබා ජා ඇල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ බෝපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ජා ඇල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ජා ඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**